

# අවදානමක් තිබේද?

- දැනට දකුණු ඉන්දීය ප්‍රාන්තයන්හි වගාවන් කා දමමින් මේ දළඹු උවදුර පැතිරී යනවා.
- මීට වසර දෙකකට පෙර (2016) දී නයිජීරියාවේ දී සොයාගත් මේ ආක්‍රමණික ආගන්තුක සළබයා දැනට අප්‍රිකානු රටවල් 44 ක පැතිරී 2018 මැයි මස ඉන්දියාවටත් ඇවිත්.
- අනවසරයෙන් රැගෙන එන ගහකොළ හරහා පහසුවෙන් මෙරටට දළඹුවා පැමිණිය හැකි අතර, සලබයා වුවත් දිනකට කි.මී. 100 ක පියාසර හැකියාවක් දරණ නිසා ඉන්දියාවේ සිට මෙරටට සුළං පහර ඔස්සේ වුවත් එන්න පුළුවන්.







# දළඹුවා හඳුනාගන්නේ කෙසේද?



## හිසේ යටිකුරු වූ " Y " අකුරක් හැඩැති සලකුණක් තිබේ



- ශරීරය පුරාම ඉදිමුණු බිබිලි වැනි දෑ ක්‍රමවත් රටාවකට තිබෙනවා.
- ඉහළින් බැලුවිට හැම ඛණ්ඩයේම මෙවැනි බිබිලි හතර බැගින් දකින්න පුළුවන්.
- අවසන් දේහ ඛණ්ඩයට පෙර ඛණ්ඩයේ මෙම බිබිල හතර කොටුවක මුලු හතර සලකුණු කරමින් පිහිටනවා.

### ජීවන චක්‍රය








# හානිය පිටතට පෙනෙන්නේ කෙසේද?

- බඩ ඉරිඟු කොළ වල සිදුරක් සෑදෙන පරිදි පළමුව කා දමා, ඉන්පසු සිදුර අතු බෙදුනු දිග සිදුරක් බවට පත්වන තුරු කා දමනවා.



- ලපටි කරල් වල මැදින් වුවද කා දමා තිබෙනවා දකින්න පුළුවන්





# දළඹුවා කැමති කෑම මොනවද?

**බඩ ඉරිඟු**
**උක්, වී, එළවලු බෝග**
**ඇතුළු ශාක වර්ග 100කට**
**වඩා කනවා**



# මර්දනය කරන්නේ කොහොම ද?

- ලොව පුරා දැන් තමයි කතාවෙන්නේ සාර්ථක මර්දන ක්‍රමයක් පිළිබඳව. ඒත් තවම නිශ්චිත විසඳුමක් නෑ.
- කෘමිනාශක වලට එරෙහිව පහසුවෙන් ප්‍රතිරෝධිතාවය ගොඩනගා ගන්නවා.
- ජෛව පාලනයක් ඔස්සේ ප්‍රශ්ණයට විසඳුමක් ලැබෙනතුරු ආරක්ෂාකාරී වීම වැදගත්.
- දුටු වහාම අතින් අහුලා මර්දනයට සැලකිලිමත් වන්න.



# දුටුවොත්

## දැනුම් දෙන්න

වහාම පලාතේ කෘෂිකර්ම බලධාරීන්ට දන්වා ගන්නොරුව පැළෑටි සංරක්ෂණ සේවයට දැනුම් දෙන්න

**දුරකථන අංකය**

0812 388 316

1920 අමතා ද දැන්විය හැකිය

**විද්‍යුත් ලිපිනය**

pps.gannoruwa@gmail.com

**තාක්ෂණික තොරතුරු**

සනත් එම්. බණ්ඩාර (සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ)
ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය, ගන්නොරුව

ආචාර්ය දයානි පෙරේරා (අතිරේක අධ්‍යක්ෂ)
පැළෑටි සංරක්ෂණ සේවය, ගන්නොරුව

ප්‍රභාත් නිශාන්ත (සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ)
උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය, ගන්නොරුව

**සැකසුම**

ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය, ගන්නොරුව

**මුද්‍රණය**

කෘෂිකර්ම ප්‍රකාශන ඒකකය, ගන්නොරුව





# සේනා දළඹුවා

F A L L A R M Y W O R M

## ඔබේ වගාවේ ඉන්නවාද?

**කුසගිනි නොසිඳෙන ආක්‍රමණශීලි දළඹුවෙක් අප්‍රිකාවේ සිට ඉන්දියාවටත් ඇවිත්...**

Fall armyworm සේ හැඳින්වෙන මේ දළඹුවා *Spodoptera frugiperda* නම් සළබයාගේ කීට අවධියයි.




කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම අමාත්‍යාංශය - 2018